## විචාර - ප්‍රතිචාර

විචාරය කිරීමත් එයට ප්‍රතිචාර දැක්වීමත් මිනිසුන් සතු අයිතියක්. ඒක කරන්නේ කොහොමද කියන එක වෙනම කාරණයක්. ඒක ලංකාවට පමණක් නොව ඕස්ට්‍රේලියාවටත් පොදුයි. විවේචන පොදුවේ ගත්තහම විවිධයි. මඩ ගැසීමේ විවේචන අද දවසේ අපට සුලබ දෙයක් වුවත් සාධාරණ හා මධ්‍යස්ථ විවේචන කලාව තුළ පමණක් නොව ඕනෑම ක්ෂේත්‍රයක ප්‍රගමනයට දියුණුවට හේතු වන්නක්. ඒත්

***සාධාරණ විවේචනයට දිය යුතු පිළිතුර නිහතමානීව තවත් නිවැරදිවීම බව මිනිසුන් වටහා ගන්නේ කවදාද***

අද දවසේ සිදුකරන ඕනෑම සාධාරණ විවේචනයක් වුවත් මඩ ගැසීමක්, පලි ගැනීමක් ලෙස අර්ථ දැක්වීම දක්වා ලඝු කොට සැලකීම කනගාටුවට කරුණක්. සත්‍ය ලෙසම විවේචන සද්භාවයෙන් කෙරුනත්, නූනත් මිනිස්සු ඒවාට පිළිතුරු දෙන්න උත්සාහ ගන්නේ ක්‍රම දෙකකින්. එකක් කිසිම දෙයක් නොතේරුන ගානට නිහඬව සිටීම හා විචාරකයන්ගේ විචාරය දෙස විචාර බුද්ධියෙන් නොබලා ඔහු සමග වෛර බැඳ ගැනීමයි. මේ දෙකම සමාජය තුළ පිරිහීමට හේතුවන කාරණාවන්. සාධාරණ විවේචනයට දිය යුතු පිළිතුර නිහතමානීව තවත් නිවැරදිවීම බව මිනිසුන් වටහා ගන්නේ කවදාද යන්නත් ගැටළුවක්. බුද්ධිය හා හැඟීම් පටලවා ගන්නා මිනිසුන් නිවැරදි කරන්නට උත්සාහ ගැනීමත් එක විදිහක අභියෝගයක්.

## සොල්දාදුවන් ගේ ආණ්ඩුව

දහසක් බලාපොරොත්තු මැද ජනතාව ගොඩනැගූ චින්තන ආණ්ඩුව වසර දෙකක් වැනි කෙටි කාලයකදී ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ වැඩිම




දූෂණ වංචා චෝදනාවලට ලක්වූ රජය බවට පත්වෙමින් රජයේ පැවැත්මත් රටේ පැවැත්මත් සොල්දාදුවන්ගේ ක්‍රියාන්විත හෙවත් යුද්ධය මතම යැපීමට පත්වීම ඛේදවාචකයක් නොවේද? එහි සැබෑ අරුත නම් ජය පරාජය කෙසේ වෙතත් මේ යුද්ධය තවත් වසර ගණනාවක් ඇදී යන බවයි. යුද්ධය නතර කලහොත් රජය පවත්වාගෙන යාමට ලැබෙන සහය නැවතී රජය කඩා වැටීමේ අවදානමද අනෙක් පසින් රටේ ආරක්ෂාව බරපතල අනතුරට පත්වීම නොවැලැක්විය හැකිය. ඉතින් කැමැත්තෙන් හෝ අකමැත්තෙන් මේ යුද්ධය රජය කල යුතුව වන්නේය. රජය පවතින්නේ යුද්ධ නිසා නම් රට රැකෙන්නේත් යුද්ධ නිසා නම් යුද්ධයට වගකියන්නේ සොල්දාදුවන් නම් මේ ඔවුන්ගේ ආණ්ඩුවක් නොවන්නේද?

## මාවිල්ආරු - දේශප්‍රේමය හා වීනාවී

අපි අහල තිබුන විජිතපුර, මුල්ලේරියාවෙල, ගන්නෝරුව, වඩමාරච්චි වගේ මහ සටන්වලට පසු වැඩිම අවධානයක් යොමුවුන සටන බවට පත් වුනේ මාවිල්ආරු මානුෂික මෙහෙයුමින් ඇරඹුනු නැගෙනහිර මුදා ගැනීමේ සටනටයි. එනිසාම තමයි එය මාවිල්ආරු මහ සටන ලෙස නම් වුනේ. දැන් තොප්පිගලටත් කොඩිය දාලා අවසානයි. මේ සටන කෙරුණ වසරක කාලය පුරා ලංකාව තුළ මෙන්ම ඕස්ට්‍රේලියාවේ ලාංකික සමාජය තුළ පැන නැගුන දේශප්‍රේමය නම් අසීමිතයි. එනිසාම යුද්ධය වෙනුවෙන් නම් කොපමණ සංවිධාන ගොඩ නැගුනද? ව්‍යාපෘති දියත් උනාද? ඒ ගැන අනන්තවත් මාධ්‍ය තුළින් දැක්කද? ඒත් මේ වාෂ්ප වෙන දේශප්‍රේමය ගැන සැබෑ කනගාටුවක් අපට දැනුනේ පසුගියදා පැවැති ''වීනාවී'' ප්‍රසංගයට සහභාගී වීමෙනුයි. පසුගිය වසර පුරාම පට්ටා ගැසූ මාවිල්ආරු සටනින් ආබාධිත වුනු සෙබලකුට පිහිටවීමේ සද් කාර්යයක් අරමුණු කොට ගෙන වුවද? කසුන් කල්හාර වැනි ප්‍රතිභාපූර්ණ කලාකරුවෙක් නොමිලයේම සිය දායකත්වය ලබා දී තිබියදී වුවද ප්‍රසංග ශාලාව පිරෙන්නට සෙනඟ නොපැමිණීම තුළ ප්‍රශ්න කීපයක් පැන නැගීම නොවැලැක්විය හැකිය. එනම් අපේ කට්ටියට ඇත්තේ සැබෑ දේශප්‍රේමයක්ද බයිට් දේශප්‍රේමයක්ද? නැත්නම් මෙවැනි කාර්යයන් කල යුත්තේ නම ගිය සංවිධාන වලින් පමණක්ද? එසේම මෙහි ඇති සංවිධානවල

***තවමත් ගීතයට සාහිත්‍යයට සෞන්දර්යට සැබෑ ලෙසම ආදරය කරන මිනිසුන් සිටීම ප්‍රීතියක්. ජීවිතය යනු යාන වාහන මිල මුදල් වැනි භෞතික සම්පත් පමණක්ම නොවන වග තේරුම් ගත් මිනිසුන් අතර ගැවසීමත් ආශ්වාදජනක කටයුත්තක්.***

නිලධාරීන් පමණක්ම සහභාගී වුවා නම් ශාලාව පුරවන්න හැකියාව නොතිබුනේද? එසේ නම් මේ සද්කාර්ය ඉතා පහසුවෙන් ඉටුකර දෙන්නට හැකියාව නොතිබුනේද? කෙසේ වෙතත් මේ පාට පාට කල්ලි ගැහුන දේශප්‍රේමය තුළ වුවද ආශ්වාදනීය ප්‍රසංගයක් අපහට ඉදිරිපත් කිරීමට මුල් වුන නදී ඇතුළු පිරිසට අපගේ ස්තුතිය හිමිවෙනවා. අවසාන වශයෙන් සන්නිවේදන කටයුතුවලදී පපුවෙන් නොව ඔලුවෙන් වැඩ කරන ලෙසද අපේ මල්ලියාට මතක් කර සිටිනවා.

## සාහිත්‍යය උත්සවය

සන්නස අනුග්‍රහයෙන් පැවැති ''පලමුවැනි තෑග්ග'' පොත එළිදැක්වීමේ සාහිත්‍ය උත්සවයට පසුගියදා සහභාගි වුණා. ඒක හොඳ කටයුත්තක්. අයහපත් කාලගුණික තත්ත්වයක් යටතේ වුවද පැමිණ සිටි ජනකාය ඔප්පු කර පෙන්වූයේ අපගේ සාහිත්‍යයේ නැගීමක් මිස වැටීමක් සිදු නොවන වග නොවේද? සාහිත්‍යය ගොඩනැගීම යනු පැහැදිලි ලෙසම රසය - රස විඳීම ගොඩනැගීමය. නිවැරදි රස විඳීම මනුෂ්‍යත්වය පරිපූර්ණ කරනවා නොවේද? මෙරට සාහිත්‍ය ගොඩනැගීමේ කටයුත්තේ දී කථිකාවන් තුළ නොරැඳී එය යථාර්ථයක් බවට පත් කිරීම ගැන සන්නස ට ගෞරවය හිමි වනවා. එහිදී නාට්‍යයක්, චිත්‍රපටයක්, විවිධ ප්‍රසංගයක් සංවිධානය කිරීම වැනි ආර්ථික වශයෙන් ලාබ ලබා දෙන කටයුත්තක් නොවන සැබෑව සාමාජීය මෙහෙවරක් වන මේ පොත දොරට වැඩීමේ කටයුත්තේ දී ශ්‍රමය, බර පැන දැරීමට නොපැකිලිව ඉදිරිපත්වීම ගැන උතුරු වික්ටෝරියානු සුබ සාධක සංගමයට අපේ ප්‍රණාමය හිමිවිය යුතුය. තවමත් ගීතයට සාහිත්‍යයට සෞන්දර්යට සැබෑ ලෙසම ආදරය කරන මිනිසුන් සිටීම ප්‍රීතියක්. ජීවිතය යනු යාන වාහන මිල මුදල් වැනි භෞතික සම්පත් පමණක්ම නොවන වග තේරුම් ගත් මිනිසුන් අතර ගැවසීමත් ආශ්වාදජනක කටයුත්තක්.

## The Challenge

පසුගිය මාසයේ සන්නස සමහර ප්‍රාන්ත වලට ප්‍රමාද වී ලැබී ඇති බැවින් සැමට සහභාගිවීමේ අවස්ථාව සළසා දෙනු වස් මේ මාසයේ මෙම විශේෂාංගය පළ නොකරන බව කරුණාවෙන් සළකන්න

පසුගිය මාසයට අදාල විසඳුම් ළබන මාසය දක්වා බාර ගන්නා බව ද දන්වමු

1st September 2007

Transformation of current Australian Migration system......

• New visa structure for skill Migration
• Higher English threshold
• Restrictions for Overseas Students to apply directly for Permanent Residence

This means that those who may qualify today may not qualify after 1st September 2007

We will ensure our commitment to provide the most technically accurate advice to explore and secure the best possible migration option under the existing legal framework for you, your relative or friend.......

Susantha Katugampala

SUSANTHA KATUGAMPALA
LL B (Monash)
Barrister & Solicitor
Registered Migration Agent: 96/86306
Australian qualified
and experienced Sri Lankan Lawyer

FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE

10, Morrison Place, East Melbourne 3002
Telephone: 61 3 9650 4557 Fax: 61 3 9650 4559
Interstate Callers: 1300 888 331

Email: info@fairfieldslawyers.com

We Deliver Results.....

GUSS F001 0402 894 942